# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය දරණ තනතුරු වන අතර, ස්ථාන මාරුවීම් රහිත වේ.

## 01. අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ/ සංවර්ධන/සමාජ විද්‍යා විෂයය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

සමග

කළමනාකරණ/සංවර්ධන/සමාජ විද්‍යා විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මානව සම්පත් පිළිබඳ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහළොවක (15) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි පළමුවන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක මානව සම්පත් විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි HM 1-1 2016 රු.(80,295 -15X2,270-114,345/-) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු.80,295/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :** පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

## 02. අභ්‍යන්තර විගණක තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අදාළව 2021.06.06 දින පළකරනලද පුවත්පත් දැන්වීම හා 2021.06.10 දින පළකරන ලද නිවැරදි කිරීමේ දැන්වීම මින් අවලංගු කරනු ලබන අතර, එම දැන්වීමට අනුව අයදුම්පත් යොමුකළ අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමුකළ යුතුය.

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය, ගණකාධිකරණය හෝ වාණිජ්‍යය ක්ෂේත්‍රයෙහි උපාධියක්

හෝ

තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය මණ්ඩලයක, හෝ පිළිගත හැකි ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදළ ක්ෂේත්‍රයේ වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස** : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි MM 1-1 රු.(53,175-10X1,375-15X1,910 -95,575/-) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු.53,175/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා/හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

**වෙනත් කරුණු :**

**සෑම ඉල්ලුම්කරුවෙක් ම,**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
iv. ඉහත තනතුරු සඳහා වන මූලික සුදුසුකම් අයදුම්පත්‍රය භාර ගන්නා අවසන් දිනය වන විට සම්පූර්ණ කර තිබිය යුතුය.

- **රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කළ යුතුය.**
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය පහත සඳහන් ලිපිනයෙහි පමණක් පිහිටුවා ඇති අතර, ශාඛා කාර්යාල නොමැත.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.11.13 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ cv@nmra.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඊ-මේල් කිරීම මඟින් හෝ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ යුතුය. ඊ මේල් මඟින් යොමු කිරීමේදී විෂය ලෙසද, තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ද අයදුම් කරන තනතුර පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

**.......................... තනතුර සඳහා අයදුම්පත**

01. පෞද්ගලික තොරතුරු :
 1.1. සම්පූර්ණ නම : ......................................
 1.2. මුලකුරු සමඟ නම : ......................................
 1.3. ස්ත්‍රී/ පුරුෂ භාවය : ......................................
 1.4. උපන් දිනය : ......................................
 1.5. වයස : අවු:................ මාස: ................ දින: ................
 1.6. ජාතික හැඳුනුම්පත් අංකය :
 1.7. දුරකථන අංකය : ස්ථාවර : ...................... ජංගම : ......................
 1.8. විද්‍යුත් තැපැල් ලිපිනය : ......................................
 1.9. ලිපිනය : ......................................
 1.10. පදිංචි දිස්ත්‍රික්කය : ......................................

02. විභාගයට පෙනී සිටින මාධ්‍යය : ......................................

03. අධ්‍යාපන සුදුසුකම් : (ඉහළම සුදුසුකමේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය/ ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන්/ සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

04. වෘත්තීය සුදුසුකම් :

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය/ ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන්/ සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

05. පළපුරුද්ද : (දැනට දරන තනතුරේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | තනතුර | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |

06. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන් :

07. අයදුම්කරුගේ සහතිකය :

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය: ......................................

**(අයදුම්කරුගේ අත්සන)**

08. රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් තම ආයතන ප්‍රධානියාගේ සහතිකය:

මෙම ඉල්ලුම්කරු වන ...................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ...................... .................. වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

......................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

**සැළකිය යුතුයි :**

**අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර,** ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් අයදුම්පත්‍රය සමඟ යොමු කල යුතු වේ. මෙම ආකෘතියට අනුව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හෝ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.